දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280

ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 ) 0112692913

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

මගේ අංකය / எனது இல / My No. ) NA/04/03/2023

ඔබේ අංකය / உமது இல / Your No. )

දිනය / திகதி / Date ) 2023.09. 22

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සියලුම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ලේකම්වරුන් වෙත,

<u>ඉගැන්වීම හා අධීක්ෂණය (මාස 12) හා චිත්තාබාධකර්මය/ මානසික හෙදකම (මාස 06) අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පශ්චාද් ප්‍රාථමික හෙද පුහුණුවට බඳවා ගැනීම - 2023</u>

ඉගැන්වීම හා අධීක්ෂණය (මාස 12) හා චිත්තාබාධකර්මය/ මානසික හෙදකම (මාස 06) අඩංගු පාඨමාලාව ඇතුලත් පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවට ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව ධාරාව යටතේ හා සීමිත ලිඛිත තරඟ විභාගය මඟින් හෙද නිලධාරි/ නිලධාරිනියන් බඳවා ගැනීම සඳහා 02-30/2023 හා 2023.02.08 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංකය අනුව රජයේ අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල සේවය කරන හෙද නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත.(ඇමුණුම 01)

02. ඒ අනුව, 1 ශ්‍රේණිය හෙද නිලධාරි (අධ්‍යාපන) තනතුරට අදාළ ව ඔබ පළාතේ පවත්නා පුරප්පාඩු අනුව සීමිත ලිඛිත ධාරාව යටතේ 100% ක ප්‍රමාණයක් සඳහා වන පරිදි II / 1 හා අධි ශ්‍රේණියේ හෙද නිලධාරි/නිලධාරිනියන්ගෙන් ඇමුණුම් අංක 01 හි දක්වා ඇති පොදු චක්‍රලේඛ ලිපියට අනුකූලව සකස් කරන ලද චක්‍රලේඛය මඟින් ඔබ පළාතේ අයදුම්පත් කැඳවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. ඔබ පළාතින් උක්ත විභාගයට පෙනී සිටින නිලධාරීන් පුහුණුව සඳහා තේරී පත්වුවහොත් පුහුණුවට බඳවා ගනු ලබන්නේ රජයේ අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහලකට අන්තර්ග්‍රහනය වී සිටියහොත් පමණක් බව එම චක්‍රලේඛයේ විශේෂයෙන් සඳහන් කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

03. සීමිත හා ලිඛිත තරඟ විභාගය සඳහා අයදුම්පත් යොමුකරන නිලධාරි/නිලධාරිනියන් විසින් විභාග ගාස්තු ලෙස රු.1,000.00 ක මුදලක් රජයේ අමාත්‍යාංශයේ ලංකා බැංකුව,තැපැල්‍රාවෙන් ශාඛාවේ අංක 7040244 දරණ "සෞඛ්‍ය ලේකම් - විභාග ගාස්තු රැස්කිරීම"ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතු ය.එසේ සීමිත ලිඛිත ධාරාව යටතේ අයදුම්පත් යොමු කරන සියලුම නිලධාරි/ නිලධාරිනියන්ගේ නාම ලේඛනය ඇමුණුම් අංක 02 හි දක්වා ඇති ආකෘතිය අනුසාරයෙන් සම්පූර්ණ කර ඔවුන්ගේ අයදුම්පත් ද සමඟ 2023.11.25 දිනට පෙර යොමු කරන මෙන් දන්වන අතර, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අයදුම්පත සමඟ අමුණා එවීමට කටයුතු කළ යුතු ය. තව ද අදාල නාම ලේඛනයේ **MS Excel** මෘදුකාංගය ආධාරයෙන් සකස් කරන ලද මෘදු පිටපතක් **<u>diradmin1@health.gov.lk</u>** යන විද්‍යුත් තැපැල මඟින් මා වෙත යොමු කළ යුතු ය.

04. සීමිත ලිඛිත ධාරාව යටතේ තෝරාගැනීමේ තරඟ විභාගය රජයේ අමාත්‍යාංශයේ විභාග ශාඛාව මඟින් පමණක් පවත්වනු ලබන අතර, විභාගය පවත්වනු ලබන ස්ථානය තීරණය වනුයේ රජයේ අමාත්‍යාංශය යටතේ අයදුම්පත් යොමුකර ඇති නිලධාරි/නිලධාරිනියන් ප්‍රමාණය හා පළාත් 09 යටතේ අයදුම්පත් යොමුකරන නිලධාරි/නිලධාරිනියන් සංඛ්‍යාව මත වේ.

05. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව ඔබ පළාතින් විභාගය සඳහා පෙනී සිටින ලද අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල ලේඛනය නොපමාව ඔබ වෙත යොමු කරන අතර, එකී නිලධාරීන් උක්ත පුහුණුවට තේරී පත්වුවහොත් රජයේ අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහලකට අන්තර්ග්‍රහනය කිරීම සඳහා මුදාහැරීම අනිවාර්ය වන බව වැඩිදුරටත් දන්වමි.

06. තව ද, පුහුණුව සඳහා බඳවාගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන් සියලු ම දෙනා පුහුණුව සඳහා අනුයුක්ත කිරීමේ දී ශ්‍රේණිය අමාත්‍යාංශය මඟින් යොමු කරනු ලබන රුපියල් එක්ලක්ෂ පනස් දහසක (150,000/=) ක ඇපකරයකට හා ගිවිසුමකට එළැඹිය යුතු ය.

07. ඒ අනුව, ඉහත කරුණු හා අවධානය යොමුකරමින් ඉගැන්වීම හා අධීක්ෂණය (මාස 12) හා වින්නඹු කර්මය/ මානසික හෙදකම (මාස 06) අදාළ පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

S. Janaka Sri Chandraguptha
Secretary
Ministry of Health
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha,
Colombo 10.

පිටපත්

01. සියලුම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරුන් - කරු.දැ.ගැ.පි /අ.ක.ස.
02. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් - කරු.දැ.ගැ.පි.
03. සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු.දැ.ගැ.පි./අ.ක.ස.